# එහෙම වෙන්නේ ඇයි?

# ?

මිනුදි පූජාගොඩ

# එහෙම වෙන්නේ ඇයි?


## මිනුදි පුජාගොඩ

කතෘ


කතෘගේ වෙනත් කෘති

සෙනුරගේ කථාව

එහෙම වෙන්නේ ඇයි

මහමායා බාලිකා විදුහල

5A

ISBN-pending

# පිදුම

මහමායා පසල් මාතාවට................

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **'හෙරණ ගේකරණී** 'ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

## 1.වහිනවිට තාර පාරවල් වලින් දුමක් නඟින්නේ ඇයි ?

තද අව්ව නිසා තාර පාර රත් වී ඇත. වහින විට තාර පාරට ජලය වැටෙන විට ඒවා වාෂ්ප වීමට පටන් ගනී. වාෂ්ප වී යන ජලය දුමක් ලෙස පෙනේ.

## 2.දේදුන්නක් අව්වත් වැස්සත් ඇති විට ඇති වන්නේ ඇයි ?

ඇතිවන්නේ ජල බිංදු හරහා හිරු කිරණ පරාවර්තනය වීමෙන් හිරු කිරණ වර්ණවලට බෙදීම හේතුවෙනි.

## 3. උගුරේ අමාරු ඇතිවිට ලුණු වතුරෙන් උගුර සෝදන්නේ ඇයි?

බොහෝ විට ඇතිවන්නේ බැක්ටීරියාවන්ගේ හේතුවෙනි උගුරේ පවතින බොහෝමයක් බැක්ටීරියාවන් ලුණු වලින් විනාශ කළ හැකි වේ

## 4.අව්වේ සිටින විට හිස වේගයෙන් රත් වන්නේ ඇයි?

කළු පැහැ පෘෂ්ඨ මගින් තාප කිරණ වැඩිපුර අවශෝෂණය කරගන්නා ගනී . හිසකෙස් සාමාන්‍යයෙන් කළු පැහැවේ ඒ හේතුවෙන් ඉක්මණින් හිස රත් වේ

## 5.මස් මී පැණිවල දමා කල්තබා ගන්නේ ඇයි

ආහාර බොහෝ විට නරක් වන්නේ සුද්‍ර ජීවීන්ගේ බලපෑම හේතුවෙන් මී පැණිවල සිනි සාන්ද්‍රණය අධිකයි. එවිට ආහාර නරක් කරන ශුද්ධ ජීවීන් ඇතුළුවුවහොත් එම ජීවීන්ගේ දේහවලින් ජලය බාහිරට විසරණය වී සමෙන් විනාශ වේ. ඒ නිසා මස් නරක් නොවේ

## 6.අකුණු ගසන විට එළිය කලින් නිකුත් වී ශබ්දය පසුව ඇසෙන්නේ ඇයි.

ආලෝකයේ වේගය ශබ්දය වේගයට වඩා ඉතා වැඩි අකුණු ගසන විට එළිය කලින්  දකින්නටත් හඬ පසුව ඇතිවීමටත් හේතුව ඒකයි

## 7.බල්ලන් නිතරම කට ඇර දිව එළියට දමාගෙන ඉන්නෙ ඇයි ?

සෑම සතෙකුටම තම ශරීරයේ නිපදවන තාපය එළියට පිට කළ යුතු ක්‍රමයක් අවශ්‍ය වේ. මිනිසුන්ගේ සම නිතර වාතයට ගැටෙන නිසා ශරීරය තාපය පිටවී යයි නමුත් බල්ලාගේ ලොම් නිසා තාපය පිට නොවේ. එනිසා බල්ලාගේ දිව එළියට යොමු කොට ශරීරයේ තාපය පිටකර ගනියි

## 8.මැටි කලයක ඇති ජලය ඇල්මිනියම් කලයට වඩා සිසිල් වන්නේ ඇයි

මැටි කලවල මැටි අතර ඇසට නොපෙනෙන සිදුරු පවතින්න නමුත් ඇලුමිනියන් කලවල එසේ නැත එම සිදුරු අතරින් පිටතට කාන්දු වන ජලය වාෂ්ප වීමට පරිසරයෙන් තාපය ලබාගනී එවිට ජලය සිසිල් වේ

## 9.හිස කෙස් හා නියපොතු කපන විට වේදනාවක් නොදැනෙන්නේ ඇයි

සාමාන්‍යයෙන් වේදනාවක් දැනෙන්නේ ස්නායු සම්බන්ධ වී ඇති විටයි හිස කෙස් හා නියපොතුවලට ස්නායු සම්බන්ධ වී නැති නිසා වේදනාවක් නොදැනේ හිස කෙස් හා නියපොතුවල ඒවායේ මූලයට පමණක්ම ඉ සම්බන්ධ වී ඇත එම නිසා නියපොතු හා කොණ්ඩය කපන විට වේදනාවක් නොදැනී

## 10.වැඩිපුර ජලය පානය කිරීම නිරෝගී දිවියකට මග පාදනවා යැයි කියන්නේ ඇයි

ජලය හොඳින් පානය කිරීම නිසා ආහාර හොඳින් ජීර්ණය වනවා මෙන්ම ශරීරයේ නිපදවන අපද්‍රව්‍ය බැහැර කිරීමද සිදුකරයි. එම නිසා ජලය වැඩියෙන් පානය කරන අයගේ මෙම ක්‍රියාවලිය වේගවත්ව සිදුවෙයි. ඒ අනුව වැඩිපුර ජලය පානය කරන අය නිරෝගී වේ

## 11.වර්ෂාව දින වල වැඩියෙන් බඩගිනි වන්නේ ඇයි?

සීතලෙන් ආරක්ෂා වීමට ශරීරය මගින් පාපය නිපදවීමට වශ්‍ය වේ ඒ සඳහා ආහාර මඟින් ශක්තිය ලබා ගනී එවිට වැඩියෙන් බඩගිනි ඇතිවේ

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විෂයෙහි කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලබූ භාග්‍යයකි එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියගේ ගුරුභවතුන් දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි නම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ නම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන

ව්‍යාපෘති නිර්මාපක සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්